# කළු ජූලියෙන් හතලිස් වසරකට පසු

අප රටේ නිදහසින් පසු එළඹි යුගයේ සිදුවූ වඩාත්ම ප්‍රචණ්ඩ දේශපාලන විනාශය වූ 1983 ජූලි දෙමළ විරෝධී සංවිධානාත්මක ජනවාර්ගික සංහාරයෙහි හතලිස්වන සංවත්සරය මෙම සතියේ යෙදේ. මෙම සිදුවීම පිළිබඳ මහජන සැමරුම් උත්සව තිබියේ වී නම් ඒ ඉතා සුළු සංඛ්‍යාවක් වීමත් එම සැමරුම්හිදී ද අවශ්‍ය ප්‍රමාණයට වඩා ඉතා අධික සංඛ්‍යාවන් ලෙස ආරක්ෂක හමුදා සහ පොලීසිය යොදවා තිබීමත් අඩුම වශයෙන් එවැනි එක් සැමරුමකදී පිරිස විසිරවීම පිණිස ඔවුන් බලය පාවිච්චි කර තිබීමත් ඉතා කණගාටුදායක සහ කනස්සල්ල දනවනසුළු තත්වයන් වේ.

1983 ජූලි විනාශය සිවිල් යුද්ධයේ පූර්ණ සන්නද්ධ අවධිය කරා ගමන්කළ අතර එය දශක තුනක කාලයක් පුරාම වාගේ ඇදී ගියේය. දෙමළ ජනයා දහස් ගණනක් ඝාතනය වූ අතර තවත් අය අවතැන් වීම සහ රටින් පලා යාමට බල කරනු ලැබීම සිදුවිය. ඔවුනට රැකවරණය සැපයීමට ධෛර්යය තිබූ සිංහල ජනතාව වෙත අපි ආචාර කරන්නෙමු. මෙමගින් ආයෝජන සහ සංචාරක ව්‍යාපාරය අතින් ගත් කළ මිලියන ගණනක ධනයක් රටට අහිමිවීම සිදුවිය. එල්.ටී.ටී.ඊ යට එරෙහි යුධ ජයග්‍රහණය 2009 මැයි මස සිදුවූ අතර මුල් ජනසංහාරයෙන් වසර හතලිහකට පසු සහ යුධ ජයග්‍රහණයෙන් වසර දාහතරකට පසු අද පවතින තත්වය වනුයේ ගැටුමට දේශපාලන විසඳුමක් තවමත් ඇති නොවී පැවතීමයි. වින්දිතයන්ගේ පවුල් විසින්, යොජිත සත්‍ය සෙවීම සහ ප්‍රතිසන්ධාන කොමිසම අවඥාවෙන් සලකා සම්පූර්ණයෙන් බැහැර කරනු ලැබ ඇත. අතුරුදහන්වීම් පිළිබඳව වූ කෘෘරත්වය දිගින් දිගටම පවතී. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අවලංගු කොට අවශ්‍ය සුදුසු නීතිකරණයන් ගෙන ඒම තවමත් සිදුවී නැත. ඒ වෙනුවට ගෙන ඒමට උත්සාහ කළ ප්‍රතිත්‍රස්ත පනත දේශීය සහ ජාත්‍යන්තර බලපෑම් හමුවේ ඒවාට ප්‍රතිචාරයක් ලෙස බහාලනු ලැබ ඇත. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනය තවමත් රටේ කිසිඳු පළාතක සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කරනු ලැබ නැත. එම සංශෝධනයේ ලබාදී ඇති පොලිස් බලතල කිසිදා ලබානොදෙනු ඇතැයි ද පෙනී යයි. යුධ අපරාධ සහ මනුෂ්‍යත්වයට එරෙහි අපරාධ පිළිබඳව වූ චෝදනාවන් සම්බන්ධයෙන් වගවීම පිළිබඳ ගැටලුව වෙත තවමත් ආමන්ත්‍රණය කරනු ලැබ නැත. මීට අමතරව ආරක්ෂක හමුදා භාරයේ පවතින ඉඩම් සහ රටේ පුරාවිද්‍යාත්මක උරුමය හා සබැඳි ඉඩම් පිළිබඳ ගැටලු මෙන්ම ආරක්ෂක හමුදා සිවිල් ආර්ථිකයෙහි නියැළී කටයුතු කිරීම ද විසඳිය යුතුව පවතින ගැටලු වේ.

ශ්‍රී ලංකාවේ පුරවැසියන් විශේෂයෙන්ම අපේ දෙමළ පුරවැසියන් සහ ඩයස්පෝරාව සංයුක්ත වන ජන කණ්ඩායම් 1983 ජූලි සිදුවීම් සහ එහි ප්‍රතිඵලයන් විසින් ගැඹුරු ලෙස කැළැල්වීමකට ලක්කරනු ලැබ ඇත. සුවවීම, සමගි සන්ධානගතවීම එක්සත් වීම මෙන්ම එක්ව ගොනුවීම ද ශ්‍රී ලංකාවට දැඩි ලෙස අවශ්‍යව පවතී. ඒ වත්මන් ආර්ථික අර්බුදය මෙන්ම අපගේ රජයේ සහ රාජ්‍යකරණයේ සුජාතභාවය, විනිවිදභාවය සහ වගවීම පිළිබඳ ගැටලු ද ජනනය කරනු ලැබ ඇති රාජ්‍යකරණයේ ගැඹුරු සහ බරපතල

අභියෝගයන් හට මුහුණදීම සඳහා ය. අපගේ රාජ්‍ය සහ මහජන කටයුතු වලින් දණ්ඩන මුක්තිය නමැති ශාපය මුළුමනින්ම මකා දැමිය යුතුය.

මේ කිසිවක් නැවත වරක් අපට සිදුවීමට කිසිසේත්ම ඉඩ තැබිය නොහැකිය. විවිධත්වය තුළ එක්සත් බව යන මූලධර්මය මත පදනම්ව අපගේ අනාගතය ගොඩනැංවීම සඳහා ඇති අවස්ථාව අප විසින් ග්‍රහණය කරගත යුතුමය. මෙය අතපසු වීමට කිසිසේත්ම ඉඩකඩ නොතිබිය යුතුය. රාජ්‍යය විසින් තම අපරාධයන් සහ අකටයුතුකම් ප්‍රසිද්ධියේ පිළිගත යුතුය. අපට අපගේ හදවතේ ත්‍යාගශීලීත්වය තුළින් වුවද සමාව දීම ඇරඹිය හැකිය.

**ආචාර්ය පාක්‍යසෝති සරවනමුත්තු**
විධායක අධ්‍යක්ෂ
විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය